ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
இலங்கை பத்திரிகை முறைப்பாட்டு ஆணைக்குழு
Press Complaints Commission of Sri Lanka

e-Newsletter

Vol: 02 Issue : 06 - September - October 2011

Tel: +94 115 353635
Fax: +94 115 335500
E-mail: pccsl@pccsl.lk
Website: www.pccsl.lk

# තෙවැනි පාර්ශවීය පැමිණිලි සලකා බැලීමට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම තීරණය කරයි



*ස්වයං නියාමනය පිළිබඳ ජාතික සමුළුවට සහභාගි වූ පිරිසෙන් කොටසක්.*



*ස්වයං නියාමනය පිළිබඳ ජාතික සමුළුවේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගි වූ ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපති සෑම් විජේසිංහ මහතා අදහස් දක්වන අයුරු. ප්‍රධාන දේශක වික්‍රම වීරසූරිය, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සභාපති කුමාර් නඩේසන් මහත්වරු ද ඡායාරූපයේ වෙති.*

තෙවැනි පාර්ශවීය පැමිණිලි සලකා බැලීමට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම, තීරණය කර ඇත.

ඒ අනුව පුවත්පතක පළකරන ලද යම් ප්‍රකාශනයකින් සෘජුවම බලපෑමට ලක් නොවී වක්‍රව බලපෑමට ලක්වන පිරිසට ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබෙයි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම, "ජනමාධ්‍ය ස්වයං නියාමනය" සම්බන්ධයෙන් සැප් 7/8 දිනයන්හි පැත්වූ ප්‍රථම ජාතික සමුළුවෙන් අනතුරුව ඒ බව නිවේදනය කළේය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ රීති සහ කාර්ය පටිපාටියට අනුව තෙවැනි පාර්ශවීය පැමිණිලි සඳහා මෙතෙක් කල් ඉඩ සැලසුණේ පැමිණිලිවල අදාළත්වය වෙන් වෙන්ව සලකා බැලීමේ පදනම මතය. එසේ කරන ලද්දේ පුවත්පත්වලට එරෙහිව තෙවැනි පාර්ශවීය පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබෙතැයි යන හේතුවෙනි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ විෂය පථය පුළුල් කිරීමට සහ හිටපු ඔම්බුඩ්ස්මන්වරයෙකු හා පාර්ලිමේන්තු මහ ලේකම්වරයෙකු වූ සෑම් විජේසිංහ මහතා ප්‍රධානත්වය දරන ආරවුල් නිරාකරණ මණ්ඩලය තෙවැනි පාර්ශවීය පැමිණිලි සලකා බැලීම ආරම්භ කිරීමට සුදුසු කාලය පැමිණ ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ හැඟීම වේ. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ලේකම් කාර්යාලය සහ ආරවුල් නිරාකරණ මණ්ඩලය එවන් තෙවැනි පාර්ශවීය පැමිණිලි සලකා බලනුයේ එහි ඇති අදාළත්වය අනුවය. ඒ අනුව නියමිත අංශ යටතේ ලැබෙන තෙවැනි පාර්ශවීය පැමිණිලි සලකා බැලෙනු ඇත.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අනුව පහත දක්වෙන අංශ යටතේ ලැබෙන තෙවැනි පාර්ශවීය පැමිණිලි සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කිරීමේ හැකියාව ඇත.

- පාරිසරික කණ්ඩායම්
- සත්ව සුබසාධක කණ්ඩායම්
- කුඩා දරුවන් වෙනුවෙන් වැඩිහිටියන්ගෙන්
- අනතුරකට භාජනය වූවෙකුගේ සමීපතම ඥාතියෙකුගෙන්
- සිරගත වූ අයෙකුගේ සමීපතම ඥාතියෙකුගෙන්
- පෞද්ගලිකව හානියක් වී ඇති පුද්ගලයෙකුගෙන් ලබා ගත් අවසරය මත ඔහු වෙනුවෙන් කරන වෙනත් අයෙකුගේ පැමිණිල්ලක්

ස්වයං නියාමන යාන්ත්‍රණය මඟින් මාධ්‍ය හසුරුවන බ්‍රිතාන්‍ය, ජර්මනිය, බොහෝ ස්කැන්ඩිනේවියානු රටවල්, බොස්නියා, හර්සගොවිනා ඇතුලු ලෝකයේ බොහෝ රටවල් තෙවැනි පාර්ශවීය පැමිණිලි සලකා බලයි.

# බ්‍රිතාන්‍ය පුවත්පත් පැමිණිලි කොමිසමේ හිටපු සභාපති පෞද්ගලිකත්වය සහ අන්තර්ජාල මාධ්‍ය නියාමනය පිළිබඳ වෙස්මිනිස්ටර් මාධ්‍ය සංවාද මණ්ඩපය අමතයි



මෙම ප්‍රශ්නය එතරම් සංකීර්ණ නොවේ. සාර්ථකත්වය බොහෝවිට ඇගයිය යුත්තේ අදෘශ්‍යමාන සාක්ෂි මගිනි. පුවත්පත් පැමිණිලි කොමිසමේ සාර්ථක ප්‍රතිඵල මතුපිටින් නොපෙනේ. එහි සාර්ථකත්වය පිළිබිඹුවන්නේ පළනොවන පුවත්පත් ලිපි මගිනි. වාර්තාකරුවන් යමෙකුගේ නිවෙස වෙත නොපැමිණෙන විටය. තවදුරටත් ලුහුනොබඳින පුවත් තුළිනි. වාර්තාකරුවන් විසින් හිරිහැර කරනු ලැබිම වැළැක්වීමට ක්‍රියාත්මක කෙරෙන අපගේ ක්‍රියාමාර්ග යන්ගේ ආධාරය ඉල්ලා සිටින බොහෝ අය සිටිති. එවැනි ආධාර ඉල්ලීම් අප වෙත ලැබුණු වහාම, වාර්තාකරුවන් හා ඡායාරූපශිල්පීන් ආපසු කාර්යාලය වෙත කැඳවන ලෙස අපි සංස්කාරකවරුන් වෙත දුරකථන පණිවිඩ යවන්නෙමු. මෙම ක්‍රමය සියයට සියයක්ම සාර්ථකය.

පළකරන ලද පුවත් සම්බන්ධයෙන් වඩාත් යෝග්‍ය ප්‍රතිකර්මය කුමක්ද? සියලුම පෞද්ගලික තොරතුරු නැවත සටහන් කෙරෙන, විශාල මුදල් කන්දරාවක් වියදම්වන හා වසර ගණනාවක් තිස්සේ ඇදීගිය හැකි නඩුවක්, නිවැරදි කිරීමේ දැන්වීමක් සමග සමාව අයදීමක් වැනි කඩිනම් සතුටුදායක ප්‍රතිඵල ලබාදෙන ක්‍රියාමාර්ගයක් තීරණය කරන ලද විනිශ්චයක් (විනිශ්චය පළකිරීමට චූදිත පුවත්පතට සිදුවේ) එමගින් ප්‍රසිද්ධ නිදොස් කිරීමක් (මුළු රටම නියෝජනය වන පරිදි පවත්වන ලද ජනමත විමසුමකදී) හෙළි වූයේ 77% ක් වැඩි කැමැත්තක් දැක්වූයේ දඬුවම් ලබාදෙන එහෙත් දිගු කාලයක් ගන්නා ක්‍රියාමාර්ගයන්ට වඩා අප්‍රමාදව සමාව අයදීම් ලබාදෙන ක්‍රමයන්ට බවයි.

## බැරෝනස් බක්කොම්බ් විය පැවැත්වූ දේශනයේ තුන්වන කොටස

එක් අතකින් සළකාබලන විට, තොරතුරු ලබාගැනීමේ අයිතිවාසිකමක් මහජනයා වෙත ඇත. අනෙක් අතට, පෞද්ගලික රහස්‍යභාවය ආරක්ෂා කරගැනීමේ අයිතිවාසිකමක් ද පුද්ගලයන් වෙත ඇත . ඉතින් නීතිය මගින් නොවේ නම්, මෙම අයිතිවාසිකම් දෙක අතර නිවැරදි සමතුලිතයක් පිහිටුවා ගන්නේ කෙසේද? මීට නිසි පිළිතුර නම් ප්‍රබල අභ්‍යන්තර සම්මුතියකි. මාධ්‍යකරුවන්ගේ එකඟත්වය ඇති රෙගුලාසි පද්ධතියක් තිබිය යුතුය. එය ඉහළින් නියෝග කරන ලද රෙගුලාසි නොවිය යුතුය. එම රෙගුලාසි පද්ධතිය ස්වාධීන මණ්ඩලයක් මගින් පරිපාලනය විය යුතු අතර , එම මණ්ඩලයේ තීරණයන්ට හා මග පෙන්වීම් වලට යටත්වීමට මාධ්‍යකරුවන් එකඟවිය යුතුය. පුවත්පත් පැමිණිලි කොමිසමේ ක්‍රියාපටිපාටියේ ප්‍රධාන ලක්ෂණ ඒවා ය.

අන්තර්ජාල මාධ්‍ය නියාමනය කිරිම විශාල අභියෝගයකි. ඉතාම දුෂ්කර ප්‍රශ්නය මම ඔබ ඉදිරියේ තබමි. අන්තර්ජාලය ඇති ලෝකය තුළ පෞද්ගලික රහස්‍යභාවය යනු කුමක්ද. වර්තමාන ලෝකය තුළ එහි කිසිදු අර්ථයක් නැති බවට තර්කයක් පවතී. එම තර්කය සමහරවිට මාර්ක් සුකර්බර්ක් පිළිගනු ඇත. අන්තර්ජාලය තුල පුද්ගලයෝ පොදු පුද්ගල ස්වරූපයක් ආරූඩ කරගෙන සිටිති. ඔවුන් පිහිටුවාගෙන ඇති තොරතුරු හුවමාරු සංස්කෘතිය අනුව පෞද්ගලික රහස්‍යභාවය "සමාජයීය ප්‍රමිතියක්" වශයෙන් බිඳවැටී ඇත.

සමහරවිට එය එසේ වන්නට ඇත. එහෙත් එය සත්‍ය බවක් මට නම් විශ්වාස කළ නොහැක.

එක් ප්‍රතිවිරුද්ධ තර්කයක් වන්නේ අන්තර්ජාලය හේතුකොටගෙන, තමන් පෞද්ගලික වශයෙන් කවරෙකුද්දයි පැහැදිළි ලෙස නිර්වචනය කිරිමට පුද්ගලයන්ට අවස්ථාව ලැබී තිබෙන බවයි "ෆේස් බුක්" තුළට ඇතුළත් කරන තොරතුරු සීමාවන් මගින්, කුමන තොරතුරු මහජන දැනගැනිම සඳහා විවෘතව පවතිද, කුමන තොරතුරු සීමාසහිත ප්‍රේක්ෂක සංඛ්‍යාවකට පමණක් වෙන්කර තිබේ ද යන බව පැහැදිලිව වෙන් කර දැක්වීමට ඔවුනට හැකි වේ.

එහෙත් ඇත්තවශයෙන්ම පැහැදිළි පිළිතුරක් නොලැබෙනු ඇත. පුද්ගලයෝ නව මාධ්‍ය විවිධ අයුරින් උපයෝගී කරගනිති. ඔවුන් එසේ කරනුයේ ඔවුන්ගේ ක්‍රියාවන්ගේ ප්‍රතිඵල ගැන අවබෝධයේ පැහැදිලි විවිධත්වයක් ද සමගය.

# පොලිස් ප්‍රකාශක ප්‍රවෘත්ති කර්තෘවරුන් හමුවෙයි



පුවත්පත් නියෝජනය කරමින් එම සාකච්ඡාවට සහභාගිවූ ප්‍රවෘත්ති කර්තෘවරු පිරිසක්



ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මැක්සි ප්‍රොක්ටර් මහතා අදහස් දක්වමින් ශ්‍රී.පු.ප.පැ.කො. දෙමළ පැමිණිලි නිලධාරි අමීන් හුසේන් මහතා, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ඉම්රාන් ෆුර්කාන් මහත්වරු ද ඡායාරූපයේ වෙති.

අපරාධ අවම කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය සහය ලබාගැනීම පිළිබඳව හිටපු පොලිස් ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මැක්සි ප්‍රොක්ටර් මහතා ප්‍රවෘත්ති කර්තෘවරු සහ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් සමග ඔක්තෝබර් 12 දින ශ්‍රී ලංකා පුවත්පත් ආයතන ශ්‍රවණාගාරයේ දී පැවැත්වූ සාංච්ඡාවේ අවස්ථාවක්. හිටපු පොලිස් ප්‍රකාශකවරයා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමෙන් කළ ඉල්ලීමකට අනුව මෙම හමුව සංවිධානය කෙරුණි.

# කර්තෘ සංසද වෘත්තීය ප්‍රතිපත්ති මාලාව




තුන්වන කොටස

### 3. නිවැරැදි කිරීම් හා සමා අයැදීම

3.1 වාර්තාවක් කරුණු අතින් වැරැදියැයි කර්තෘට පෙනී යන අවස්ථාවකදී එය නිසි ප්‍රමුඛතාවක් හා යෝග්‍ය වන්නේ නම් සමා අයැදීමක්ද ඇතිව, එම නිවැරැදි කිරීම හා සමා අයැදීම පීඩිත පාර්ශවයේ කැමැත්තට පටහැනි වන අවස්ථාවකදී හැර, අනෙක් හැම විටෙකදීම වහාම නිවැරැදි කළ යුත්තේය.

### 4. පිළිතුරු දීමට අවස්ථා

4.1 කරුණු අතින් සාවද්‍ය ප්‍රකාශන නිසා පුද්ගලයන්ගේ හෝ සංවිධානවල හෝ කීර්තියට, ගෞරවයට, නම්බුවට, හැඟීම්වලට පෞද්ගලිකත්වයට හා නිලයට හානි සිදුවන්නේ නම්, ඒ ප්‍රකාශනවලට පිළිතුරු දීම සඳහා සාධාරණ හා යුක්ති සහගත අවස්ථාවක් ඒ පුද්ගලයනට හෝ සංවිධානවලට හෝ දිය යුත්තේය. එම පිළිතුරු සිය කරුණු පැහැදිලි කිරීම සඳහා පැමිණිලිකරු/පැමිණිලිකාරිය කරන ප්‍රකාශයට සීමා විය යුතු අතරම, සිදුවිණැයි කියන වරද නිවැරැදි කිරීම පිණිස අවශ්‍ය ප්‍රමාණයට වඩා එය දීර්ඝද නොවිය යුත්තේය.

4.2 වරද ගැන සමාව අයැදීම හෝ කනගාටුව පළ කිරීම වෙනුවට පැමිණිලිකරුගේ /පැමිණිලිකාරියගේ පිළිතුරට ප්‍රතිචාර දක්වන කතුවරු හෝ පුවත්පත් කලාවේදියෝ ඊට පිළිතුරු දීමේ තවත් අවස්ථාවක් අතෘප්ත පාර්ශවයට සලසා දීමට සූදානම් විය යුත්තෝය.

### 5. රහස්‍ය මූලාශ්‍ර

5.1 තොරතුරුවල රහස්‍ය මූලාශ්‍රය, එය අනාවරණය කිරීමේ අවසරය ඒ මූලාශ්‍රයෙන්ම නොලැබෙන තෙක් හෙළිදරවු නොකිරීමේ සදාචාරත්මක වගකීමක් සෑම පුවත්පත් කලාවේදියකුටම/වේදිනියකටම ඇත්තේය.

## ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වාර්ෂික මහා සභා රැස්වීම





ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වාර්ෂික මහා සභා රැස්වීම සැප්තැම්බර් 26 වන දින ශ්‍රී ලංකා පුවත්පත් ආයතන ශ්‍රවණාගාරයේදී පැවැත්වුණි. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිළි කොමිසමේ සභාපති කුමාර් නඩේසන් මහාතා එහිදී අදහස් දක්වන අයුරු සහ රැස්ව සිටි සාමාජිකයින් පිරිසක්.

## සිරි රණසිංහ මහතා ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩලයට



*ලංකාදීප පුවත්පතේ ප්‍රධාන කර්තෘ සිරි රණසිංහ මහතා, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩලයට තෝරාපත්කර ගැනිණ. පසුගිය සැප්තැම්බර් මස 26 දා පැවති ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඒ මහතා එම ධුරයට පත්කර ගැනුණි. හෙතෙම ශ්‍රී.ල.පු.ප.පැ.කො. ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සාමාජිකයෙක්ද වේ.*

## ආරවුල් නිරාකරණ මණ්ඩලය

සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ කලක් පාර්ලිමේන්තුවේ මහ ලේකම් වරයා වශයෙන් මෙන්ම දුක්ගන්නාරාල (ඔම්බුඩ්ස්මන්වරයා) වශයෙන් කටයුතු කළ සෑම් විජේසිංහ මහතාය. ආරවුල් නිරාකරණ මණ්ඩලය, සිවිල් සමාජ නියෝජිතයන් හය දෙනෙකුගෙන් සහ පුවත්පත් කර්මාන්තයේ නියෝජිතයන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. එම මණ්ඩලයේ නියෝජිතයන් වශයෙන් ආචාර්ය දෙවනේසන් නේසය්යා, සිත්ති තිරුචෙල්වම්, ජාවේඩ් යුසුෆ්, ලුසිල් විජේවර්ධන, සිරි රණසිංහ, විජිතා ප්‍රනාන්දු, ප්‍රමෝද් ද සිල්වා, ඩයන් ස්කුමන්, දයා ලංකාපුර, වී.තේවරාජ් යන මහත්ම මහත්මීහු කටයුතු කරති.

# ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය පැවැත්වූ ඒකාබද්ධ ප්‍රවර්ධන වැඩසටහන්හි අවස්ථා කිහිපයක්



සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යාපනය විෂය හදාරණ ගාල්ල දිස්ත්‍රික් සිසු සිසුවියන් සඳහා සැප්තැම්බර් 17 දින ගාල්ල මහින්ද විද්‍යාලයේ පැවති සම්මන්ත්‍රණයේ අවස්ථාවක්.



'වගකීම් සහගත ජනමාධ්‍ය භාවිතය' මැයෙන් ගාල්ල දිස්ත්‍රික් ජනමාධ්‍යවේදීන් සඳහා සැප්තැම්බර් 18 දින වක්වැල්ල සංවර්ධන හා කළමනාකරණ පුහුණු ආයතනයේ පැවති සම්මන්ත්‍රණයේ අවස්ථාවක්.



රත්නපුර දිස්ත්‍රික් සිවිල් සමාජ නියෝජිතයන් දැනුවත් කිරීම සඳහා ඔක්තෝබර් 14 දින රත්නපුර තානායමේ දී පැවති සංවාදශීලි හමුවේ අවස්ථාවක්.




'වගකීම් සහගත ජනමාධ්‍ය භාවිතය' මැයෙන් රත්නපුර දිස්ත්‍රික් ජනමාධ්‍යවේදී-න් සඳහා ඔක්තෝබර් 15 දින රත්නපුර තානායමේ දී පැවති සම්මන්ත්‍රණයේ අවස්ථාවක්.



සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යාපනය විෂය හදාරණ සිසුවියන් සඳහා ඔක්තෝබර් 28 දින පානදුර බාලිකා විදුහලේ දී පැවති සම්මන්ත්‍රනයේ අවස්ථාවක්.

## අධ්‍යක්ෂ මණ්ඩලය:

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වත්මන් සභාපතිවරයා වන්නේ සිවකුමාර් නඩේසන් මහතාය. නිමල් වෙල්ගම මහතා, සිංහ රත්නතුංග මහතා, මනික් ද සිල්වා මහතා, එන්. එම්. අමීන් මහතා, සුන්දර නිහතමානි ද මැල් මහතා, සිරි රණසිංහ මහතා, සීතා රංජනී මෙනවිය යනාදීහු අධ්‍යක්ෂවරු වශයෙන් කටයුතු කරති.

## ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ලේකම් කාර්යාලය

**කමල් ලියනආරච්චි** - ප්‍රධාන විධායක නිලධාරී(වැ. බ), සිංහල පුවත්පත් පැමිණිලි නිලධාරී,
**සුකුමාර් රොක්වුඩ්** - ඉංග්‍රීසි පුවත්පත් පැමිණිලි නිලධාරී, **අමීන් හුසේන්** - දෙමළ පුවත්පත් පැමිණිලි නිලධාරී




පිටු සැකසුම : එස්. ප්‍රියදර්ශිනි
ඡායාරූප : මිල්රෝයි ඇන්තනි - ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය